## 1.3 මස්තිෂ්ක ආඝාත රෝග තත්ත්වය පිළිබඳ වාග්විද්‍යාත්මක අධ්‍යයනයක්

පී. ඒ. දිල්මිණි කුමාරි පෙරේරා
වාග්විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය,

## ABSTRACT

මිනිස් භාෂාව අසමසම වූවකි. එය පුද්ගලයන් අතර අදහස් හුවමාරු කරගනිමින් සන්නිවේදනය ඇති කරයි. ලෝකයේ අන්‍ය සත්ත්වයන්ට නොමැති වූ විශේෂිත වරප්‍රසාදයක් ලෙස "භාෂාව" මනුෂ්‍ය වර්ගයාට ලැබී ඇත. භාෂාව සෑම නිරෝගී පුද්ගලයකුට ම පොදු වුව ද මනුෂ්‍ය සංහතිය තුළ එය නිවැරදි ලෙස භාවිත කළ නොහැකි, සන්නිවේදනය මුළුමනින් ම අහිමි පුද්ගලයන් ද දක්නට ලැබේ. එබැවින් මෙහි දී මාගේ මූලික අවධානය යොමුවූයේ සන්නිවේදනය අහිමි වීමට බලපානු ලබන භාෂා හා භාෂණ දුබලතාවක් වන මස්තිෂ්ක ආඝාත රෝග තත්ත්වය පිළිබඳ ව හැඳින්වීමයි. මිනිස් මොළය කෙතෙක් දුරට මිනිසාගේ ක්‍රියාකාරීත්වය සඳහා උපකාර වන්නේ ද, එයට සිදුවන හානි හේතු කොටගෙන ඇතිවන අතුරු ප්‍රතිඵල කෙරෙහි ද අවබෝධ කරවීම මාගේ තවත් අරමුණකි. මෙම රෝග තත්ත්වයෙන් පෙළෙන රෝගීන්ගේ ශබ්ද උච්චාරණයෙහි දක්නට ලැබෙන විශේෂතා වාග්විද්‍යාත්මක ව ලබාගත් දැනුම (පර්යේෂණයට බඳුන් වූ - රාගම පුනරුත්ථාපන රෝහලේ වයස අවුරුදු 05 - 15 අතර) පැහැදිලි කිරීම ද බලාපොරොත්තු වේ.

මොළය කොටස් දෙකකි.

1. වම් මස්තිෂ්ක අර්ධගෝලය
2. දකුණු මස්තිෂ්ක අර්ධගෝලය

වශයෙනි.

එක් මස්තිෂ්ක අර්ධගෝලයකින් ශරීරයේ හරි අඩක් එනම් අර්ධගෝලයේ පිහිටීමට විරුද්ධ දිශාවෙහි මාංශපේශී චලනය, සංවේදීතාව පාලනය කෙරෙන අතර එක් අර්ධගෝලයකට හානියක් සිදු වුවහොත් ඊට ප්‍රතිවිරුද්ධ දිශාවෙහි ශරීරයේ කොටස් අක්‍රීය වීම මස්තිෂ්කයේ ස්වභාවයයි.

## What is Cerebral Palsy

"Cerebral Palsy Means : brain paralysis. It is a disability that attests movement and body position. It comes from brain damage that happened before the baby was born, at birth or as a baby."

**මොළයෙහි අඩපණ වීමක් ;**

දරුවකු ඉපදීමට පෙර, ඉපදීමේ දී හා ඉපදීමෙන් පසු මොළයේ සිදු වූ හානියක් හේතු කොටගෙන ශරීරයේ චාලක දුබලතා හා සමබරතාවයට හානි පමුණුවන රෝග තත්ත්වයකි.

මෙම අධ්‍යයනය මගින් මස්තිෂ්ක ආඝාත රෝග තත්ත්වයත්, ඊට පදනම් වූ හේතු කෙරෙහිත් අවබෝධයක් ලබාගත හැකිවෙයි. දෙවනුව සන්නිවේදන හා චාලක දුබලතාවන් අනුව එය වර්ගීකරණය කරන ආකාරයත්, ඒවා අවබෝධ කරගන්නා අයුරු පිළිබඳවත් දැනුම වැඩිකර ගත හැක. මීට අමතර ව සන්නිවේදන දුබලතා, මනෝවිෂයක වාග්විද්‍යාව, විශේෂ අධ්‍යාපන, සායනික වාග්විද්‍යාව ආදි විෂය ක්ෂේත්‍ර අධ්‍යයනයේ දී දැනුම ලබා ගැනීමට මහත් පිටුබලයක් වෙයි.